ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2013 සැප්තැම්බර් 30 වැනි දින |

**ආහාර මිල ගණන් අඩු වීමෙන් 2013 සැප්තැම්බර් මාසයේ දී උද්ධමනය පහළ වැටේ.**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (2006/2007=100) මගින් මනිනු ලබන උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත, පූර්ව මාසයේ වාර්තා කළ සියයට 6.3 හි සිට 2013 සැප්තැම්බර් මාසයේ දී සියයට 6.2 දක්වා පහළ වැටිණි. මෙයට, ප්‍රධාන වශයෙන්ම, ආහාර මිල ගණන් පහළ මට්ටමක පැවතීම හේතු විය. වාර්ෂික සාමාන්‍ය පදනම මත මූලික උද්ධමනය ද අගෝස්තු මාසයේ වාර්තා කළ සියයට 8.0 හි සිට සැප්තැම්බර් මාසයේ දී තවදුරටත් සියයට 7.8 දක්වා අනුයාත සිව්වන මාසයටත් පහළ ගියේය.

මූලික උද්ධමනය, ලක්ෂ්‍යමය සහ වාර්ෂික සාමාන්‍ය යන දෙයාකාරයෙහි ම පදනම මත අගෝස්තු මාසයේ පැවති සියයට 3.1 හි සහ සියයට 5.9 හි සිට 2013 සැප්තැම්බර් මාසයේ දී පිළිවෙළින් සියයට 3.0 සහ සියයට 5.7 දක්වා පහළ වැටිණි.




කො.පා.මි. දර්ශක අගය 2013 අගෝස්තු මාසයේ පැවති 176.2 හි සිට 2013 සැප්තැම්බර් මාසයේ දී 175.8 දක්වා නිරපේක්ෂ වශයෙන් අඩු වෙමින් පූර්ව මාසයට සාපේක්ෂව සියයට 0.2 කින් පහළ ගියේය. ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග අයත් උප කාණ්ඩයේ මිල ගණන් සියයට 0.5 කින් පහළ යාම දර්ශකයේ මෙම මාසික අඩු වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක විය. ආහාර කාණ්ඩය තුළ බොහොමයක් සහල් වර්ග, එළවළු, නැවුම් මත්ස්‍ය වර්ග, කරවල, කුකුළු මස්, අර්තාපල්, අමු මිරිස් සහ ලොකු ළූණු ආදියෙහි මිල ගණන් මෙම මාසය තුළ පහළ ගියේය. කෙසේ වුව ද, සමහර පළතුරු වර්ග, පොල්, ළදරු කිරිපිටි, බිත්තර, රතු ළූණු සහ දෙහි යන ආහාරවල මිල ගණන්හි ඉහළ යාමක් වාර්තා විය. ආහාර නොවන කාණ්ඩයේ, රෙදිපිළි හා පාවහන් උප කාණ්ඩයෙහි මිල ගණන් සියයට 0.3 කින් පහළ වැටිණි. කෙසේ වුවද, නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන (සියයට 0.1); ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු (සියයට 0.1); සෞඛ්‍ය (සියයට 0.2); ප්‍රවාහන (සියයට 0.1); විනෝදාත්මක හා සංස්කෘතික (සියයට 1.0); සහ විවිධ භාණ්ඩ හා සේවා (සියයට 0.1) යන උප කාණ්ඩයන්හි මිල ගණන් මෙම මාසය තුළ ඉහළ ගියේය. මේ අතර, සන්නිවේදන සහ අධ්‍යාපන උප කාණ්ඩයන්හි මිල ගණන් මෙම මාසය තුළ නොවෙනස්ව පැවතිණි.